# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 13,903 — 1964 ජනවාරි 4 වැනි සෙනසුරාද — 1964.1.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

### විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

#### රේගු නිවේදනය අංක 61/9/111

ආදයම් රක්ෂණ ආඥපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වෙනි දින දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥව අනුව, 1964 ජනවාරි මස 6 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... | 98 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... | 03 |

ඩබ්ලිව්. පද්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ 781,
1964 ජනවාරි මස 4 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1–274

---

#### රේගු දැන්වීම අංක 63/1/53

1963 ජනවාරි මස 7 වෙනි දින අංක 13,470 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥව ක්‍රියාත්මක කිරීම සඳහා, 1964 ජනවාරි මස 6 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලංඩන් වෙළඳ පොළෙහි සිංගප්පූරු පොල්තෙල්වල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් පවුම් 102 සිලිම් 10 පැන්ස 10 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව රු. ශ. | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව රු. ශ. | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව රු. ශ. | අමු පොල්ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව රු. ශ. |
|---|---|---|---|
| 240 78 | 204 38 | 173 57 | 60 20 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥපනත හැර අන් කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ඩබ්ලිව්. පද්මනාදන්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ 744/15,
1964 ජනවාරි මස 4 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1–275

---


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

17—ආර් 14910—5,535 (64/1)